**ශ්‍රී ලංකා මහ බැංකුව**

**බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**

**2019 මැයි 21** **චක්‍රලේඛය** **2019 අංක 01**

---

**සංචාරක කර්මාන්තය සඳහා සහන ලබා දීම**

රට තුල වර්තමානයේ පවතින තත්ත්වය නිසා සංචාරක කර්මාන්තයට බලපා ඇති අහිතකර තත්ත්වය පිළිබඳ දැක්මෙන් යුතුව සංචාරක කර්මාන්තයේ නියුතු සහන බලාපොරොත්තු වෙන පුද්ගලයන් හෝ ආයතන වලට පහත සඳහන් සහන සලසා දෙන මෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් / විශේෂිත කල්බදු මූල්‍යාකරණ සමාගම් වලින් ඉල්ලා සිටියි.

i. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හෝ සංචාරක කර්මාන්තයට පහසුකම් සපයන වෙනත් ඕනෑම අධිකාරියක/ නියෝජිත ආයතනයක ලියාපදිංචි පුද්ගලයන් හා ආයතන සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යාකරණ සමාගම්, වෙන් වෙන් වශයෙන් සලකා බලමින් සහන කාලයන් ලබා දිය යුතුය (ඇමුණුම 1)

ii. 2019.04.18 දින වන විට ගෙවීමට ඇති සක්‍රීය ණය පහසුකම් සඳහා (මුල් මුදල හා පොළිය) 2020 මාර්තු මස දක්වා සහන කාලයක් ලබා දිය යුතුය.

iii. බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යාකරණ සමාගම් වල අධ්‍යක්ෂ මණ්ඩලය හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය පවරා ඇති ඕනෑම අධිකාරියකට සහන කාලය සලසාදීම අනුමත කල හැකිය.

iv. බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යාකරණ සමාගම් සහන කාල සීමාව තුල අය විය යුතු මුල් මුදල හා පොළී මුදල, 2020 ජූලි මස සිට අයකර ගන්නා කාලීන ණයක් බවට පරිවර්තනය කල යුතුය. මේ පහසුකම සඳහා සහනදායී පොලී අනුපාතයක් අය කල හැකිය.

v. බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යාකරණ සමාගම් හා ගනුදෙනුකරු විසින් ඉහත ණය ආපසු ගෙවන කාල සීමාව හා පොලී අනුපාතය සඳහා එකඟතාවක් ඇති කර ගත යුතුය.

vi. බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යාකරණ සමාගම් විසින් සහන කාල සීමාව තුලදී, අක්‍රීය ණය පහසුකම් වර්ග කිරීම හා වෙන් කිරීමේ අවශ්‍යතාවය සඳහා පෙර වර්ගීකරණය යටතේ ම පවත්වාගෙන යා යුතුය.

vii. සහන කාල සීමාව තුලදී, බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යාකරණ සමාගම් අක්‍රීය ණය සඳහා දඩ පොලී මුදල් අය නොකල යුතුයි.

viii. බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යාකරණ සමාගම් විසින් එවැනි සහන සලසා දීම සඳහා අවශ්‍ය වන ලිපිගොනු පවත්වාගෙන යා යුතුය.

ix. බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යාකරණ සමාගම් ඇමුණුම II ආකෘතියට අනුව සහන ලබාගත් ගනුදෙනුකරුවන් පිළිබඳව ඊළඟ මාසයේ 15 දින වන විට මාසික පදනමින් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත වාර්තා කල යුතුය.

*ඩබ් රණවීර*
*අධ්‍යක්ෂ*
*බැංකු නොවන මූල්‍ය ආයතන*
*අධීක්ෂණ දෙපාර්තමේන්තුව*

ඇමුණුම 1

## 2019 අංක 01 දරන චක්‍රලේඛයේ අර්ථ දැක්වීම

1. **තනි පුද්ගලයන්**

සංචාරක ක්ෂේත්‍රයට සේවා සපයන පුද්ගලයන් හා සංචාරක ක්ෂේත්‍රය තුල සංචාරක සේවා සපයන ආයතන වල ස්ථිර සේවකයන් මේ ගණයට ඇතුළත් වේ.

2. **ලියාපදිංචිය**

(i) සංචාරක සේවා සපයන ව්‍යාපාරික සහ පුද්ගලික ආයතන 2019.04.18 දින වන විට පහත දැක්වෙන කුමන හෝ ආයතනයක ලියාපදිංචි වී තිබිය යුතුය.

අ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය යටතේ ඇති නියෝජිත ආයතන

i. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

ii. ශ්‍රී ලංකා සංචාරක සම්මුති කාර්යාංශය

iii. ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමණාකරන ආයතනය

ඇ) ශ්‍රී ලංකා හෝටල් සංගමය

(ii) 2019.04.18 දින වන විට ඉහත දැක්වූ 2(i) යටතේ ලියාපදිංචි වී නොමැති ආයතන, මෙම ණය සහන ලබා ගැනීමට අවම වශයෙන් ප්‍රාදේශීය සභා, නගර සභා හෝ මහා නගර සභා යන පලාත් පාලන ආයතන වල 2019.04.18 දින වන විට ලියාපදිංචි වී තිබිය යුතු අතර එම ආයතන සහ පුද්ගලයන් 2(i) හි ඉහත දැක්වූ ආයතනයක/ ආයතනවල ද තම ලියාපදිංචිය ලබා ගත යුතු වේ.

3. **සහන කාලය අනුමත කිරීම**

(i) සහන කාලය ලබා ගැනීමට බලාපොරොත්තු වන ආයතන හා පුද්ගලයන් අදාල බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත එම ඉල්ලීම ඉදිරිපත් කල යුතුය.

(ii) බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ඉහත 2 ඡේදයේ දක්වා ඇති අවශ්‍යතාවයද ඇතුලත්ව එම ඉල්ලීම් වෙන් වෙන් වශයෙන් සලකා බලා යෝග්‍යතාව තක්සේරු කල යුතුය.

(iii) 2019.04.18 දින වන විට පුද්ගලයන් සහ ආයතන වල පැවති සක්‍රීය ණය පහසුකම් (මුල් මුදල සහ පොළී මුදල) සඳහා සහන කාලය ලබා දිය යුතුය.

4. **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 09 යටතේ ගිණුම්කරණ ක්‍රමවේද**

බලපත්‍රලාභී මුදල් සමාගම්/ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් පොලී ආදායම හඳුනාගැනීම සහ මූල්‍ය වත්කම් ගිණුම්කරණයේදී ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සපයා ඇති උපදෙස් වලට අනුකූල විය යුතුය.

ඇමුණුම II

## 2019 අංක 01 දරන චක්‍රලේඛය

### සංචාරක කර්මාන්තය සඳහා ලබා දී ඇති සහන ලබා ගැනීමට බලාපොරොත්තු වන ණයගැනුම්කරුවන්ගේ විස්තර

බ.මු. සමාගමේ / වි. ක. මු. සමාගමේ නම : ........................................................................ ...................... දින දක්වා

| අනුක්‍රමික අංකය | ණයගැනුම්කරුගේ නම | 2019.04.18 දිනට ගෙවීමට ඇති මුදල (රු. '000) | සහන කාලය සඳහා සලකා බලන මුදල (රු. '000) | ණය වර්ගීකරණය (සක්‍රීය/ අක්‍රීය) | සහන කාල සීමාව තුල ගෙවීමට ඇති මුදල් සඳහා පිරිනමන නව ණය | |
|---|---|---|---|---|---|---|
| | | | | | ආපසු ගෙවන කාල සීමාව | පොලී අනුපාතය |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

ඉහත තොරතුරු මාගේ දැනුමේ හා විශ්වාසය අනුව නිවැරදි බව තහවුරු කරමි.

..................................................................

බලයලත් නිලධාරියාගේ නම සහ නිලය

කරුණාකර ඊළඟ මාසයේ 15 දිනට විද්‍යුත් තැපෑලෙන් dsnbfi@cbsl.lk වෙත ලැබීමට සලස්වන්න